## අන්තඃ ගර්භාෂ තැන්පතුව කොතරම් කලක් භාවිතා කළ හැකිද?

- එය තැන්පත් කළ පසු අවුරුදු 10 ක කාලයක් දක්වා තබා ගත හැකිය
- ඒ අතර දරුවෙක් අවශ්‍ය වුවහොත් එය පහසුවෙන් ඉවත් කරවා ගෙන ඕනෑම අවස්ථාවක සරුභාවයට පත් විය හැකිය

## අන්තඃ ගර්භාෂ තැන්පතුව තැන්පත් කිරීමෙන් ඇති විය හැකි ශාරීරික අපහසුතා කවරේද?

- යටි බඩේ වේදනාවක්, මඳ යෝනි රුධිර වහනයක් වැනි අපහසුතා ඇති විය හැකි වුවත් ඒවා ඉතා තාවකාලික වේ
- ඇති වන අපහසුතාවයකදී සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී හෝ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගෙන් උපදෙස් ලබා ගන්න

අන්තඃ ගර්භාෂ තැන්පතුව හදිසි පවුල් සැලසුම් ක්‍රමයක් ලෙසද භාවිතා කල හැකිය

වැඩිදුර විස්තර සඳහා වෛද්‍යවරයෙක් හෝ පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියක් හමුවන්න

## සාර්ථකත්වය

- මෙය නිසි ලෙස තැන්පත් කරන ලද කාන්තාවන්ගෙන් 99.4% කටම අනවශ්‍ය ගැබ් ගැනීමක් ඇති නොවේ.

අන්තඃ ගර්භාෂ තැන්පතුව නිසා ලිංගික ක්‍රියාවලියට කිසිසේත්ම බාධාවක් සිදු නොවේ.

## පසු විපරම

- තැන්පත් කිරීමෙන් මසකට පමණ පසුව පරීක්ෂා කරවා ගත යුතුය.
- අවශ්‍ය අවස්ථාවකදී නිවසේදීම මෙය පරීක්ෂා කර ගන්නා ආකාරය ඔබගේ පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියගෙන් අසා දැන ගන්න.

## වැඩිදුර උපදෙස් සඳහා හමුවන්න

- සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන්
- වෛද්‍ය නිළධාරීන්
- ලියාපදිංචි වෛද්‍ය නිළධාරීන්
- මහජන සෞඛ්‍ය හෙද සොහොයුරියන්
- පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියන්

**සුවසැරිය ✆ 1999**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ, පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ සහ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රකාශනයකි

නිසි කල රිසි ලෙස දරු සම්පත

**ප්‍රීතිමත් යුග දිවියක් උදෙසා...**





# අන්තඃ ගර්භාෂ තැන්පතුව

(IUD)

## අන්තඃ ගර්භාෂ තැන්පතුව යනු කුමක්ද?

- කාන්තාවකගේ ගර්භාෂයේ තැන්පත් කරන T හැඩැති තඹ අඩංගු ඉතා කුඩා ප්ලාස්ටික් නිපැයුමකි
- මෙය හෝමෝන අඩංගු නොවන පවුල් සැලසුම් ක්‍රමයකි






## මෙමඟින් අනවශ්‍ය ගැබ් ගැනීමක් වළක්වා ගන්නේ කෙසේද?

- ප්‍රධාන වශයෙන් ඩිම්බය (ස්ත්‍රී බීජය) හා ශුක්‍රාණුව (පුරුෂ බීජය) එකතු වීම වැළැක්වීමෙන්

## අන්තඃ ගර්භාෂ තැන්පතුව වඩා සුදුසු කාහටද?

- දරු උපතකින් පසු ඊළඟ දරු ගැබ දක්වා සුදුසු පරතරයක් තබා ගැනීමට
- බලාපොරොත්තු තරම් දරුවන් සිටින නමුත් ස්ත්‍රී ස්ථිර සැත්කමට අකමැති විට
- ආර්ථවහරණය දක්වා ගැබ් ගැනීමක් වලක්වා ගැනීමට අවශ්‍ය බොහෝ කාන්තාවන්ට



## අන්තඃ ගර්භාෂ තැන්පතුව නුසුදුසු වන්නේ ප්‍රධාන වශයෙන් කාහටද?

- හේතුව නොදන්නා යෝනි රුධිර වහනයක් ඇත්නම්
- ප්‍රජනක පද්ධතියේ ආසාදනයක් තිබේ නම්
- ගැබ් ගෙල පිළිකා තත්ත්වයක් තිබේ නම්

## අන්තඃ ගර්භාෂ තැන්පතුව තැන්පත් කිරීමට සුදුසු කුමන අවස්ථාවල දීද?

- ඔසප්වීම ඇරඹී දින 12 ක් ඇතුලත
- දරු ප්‍රසූතියෙන් පැය 48 ක් ඇතුලත
- සාමාන්‍ය දරු උපතක් සිදුවී සති 4 කින් පසු
- සිසේරියන් සැත්කමක් සිදුකර සති 6 කින් පසු
- අනාරක්ෂිත ලිංගික එකතු වීමකින් පසු දින 5 ක් ඇතුළත හදිසි පවුල් සැලසුම් ක්‍රමයක් ලෙස
- ගබ්සාවක් සිදුවීමෙන් පසු දින 12 ක් ඇතුලත
- වෙනත් පවුල් සැලසුම් ක්‍රමයක් නිසි ලෙස භාවිතා කරමින් සිටී නම් එම ක්‍රමය නැවැත්වූ විගස
- ගර්භණී නොවන බව නිශ්චිතවම තහවුරු කරගත් ඕනෑම අවස්ථාවක

## අන්තඃ ගර්භාෂ තැන්පතුව තැන්පත් කරන්නේ කෙසේද?

- පවුල් සැලසුම් සායනයකදී වෛද්‍යවරයකු හෝ හෙද සොහොයුරියක් විසින් මෙය තැන්පත් කරනු ඇත
- දරු ප්‍රසූතියක් සිදුවූ වහාම වෛද්‍යවරයෙකු විසින් රෝහලකදී තැන්පත් කරනු ඇත
- මේ සඳහා ගත වන්නේ මිනිත්තු කිහිපයක් පමණි

**නිසි ලෙස ගර්භාෂයේ තැන්පත් කළ පසු මෙය ශරීරය තුළ අනිත් අවයව වලට ගමන් නොකරයි.**